**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

**01 . මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

ස්ථාවර වත්කම් ලේඛනය අනුව දැක්වෙන එකතුව රු.299,581 ක්වූ වත්කම් වර්ග 03 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,144,595 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.410,808 ක් විය.

**2.2.** **ආදායම් පරිපාලනය**

**------------------------**

**2.2.1** **වරිපනම් බදු**

**---------------**

සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව පිළිවෙලින් රු.159,710 ක් සහ රු.246,468 ක්වූ වරිපනම් බදු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.2** **හිඟ බදු කුලී**

**---------------**

වර්ෂ 06 කට පෙර සිට අයවියයුතු රු.592,618 ක්වූ හිඟහිටි බදු කුලී අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.2.3** **බලපත්‍ර ගාස්තු**

**------------------**

සභා බල ප්‍රදේශය තුල ඉදිකර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ස්ථාන 05 කින් අය කරගත යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තු, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4** **මුද්දර ගාස්තු**

**-----------------**

2013,2014 හා 2015 වර්ෂවලට අදාළව සභාවට ලැබිය යුතු රු.1,606,680 ක් හිඟ මුද්දර ගාස්තු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 46 දෙනෙක් වූ අතර සේවයේ නියුතු ස්ථිර කාර්ය මණ්ඩලය 52 ක් විය. අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවන සේවකයන් 06 දෙනෙකුගේ අතිරික්තයක් තිබියදී සමාලෝචිත වර්ෂයේදී අනියම් හා ආදේශක සේවකයන් 10 දෙනෙකු සේවයේ යොදවා ගෙන සභා අරමුදලින් රු.1,793,975 ක්වූ වැටුප් ගෙවා තිබුණි. තවද මෙම මුදල් ප්‍රතිපූර්ණ වැටුප් වශයෙන් ආපසු නොලැබෙන බවද තහවුරු විය.

**3.2** **කාර්ය සාධන ඇගයිම**

**--------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව සභාවේ ක්‍රියාකාරකම් මෙහෙයවා නොතිබුණි.

**3.3** **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**------------------------------------------------------------**

2015 පෙබරවාරි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව කටයුතු කරමින් සභාවේ හිටපු සභාපතිවරයා හා මන්ත්‍රීවරියක් විදේශ සංචාර දෙකකට සහභාගීවී තිබුණු අතර ඒ වෙනුවෙන් සභා අරමුදලින් රු.200,000 ක් වැයකර තිබුණි.

**04.** **පද්ධති හා පාලනය**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය